# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2274/32 - 2022 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2022.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පොතුවිල් ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම.**

අවසර ලබා නොගෙන මාස තුනක කාල සීමාවක් ප්‍රාදේශීය සභාවේ රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන පොතුවිල් ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින්ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ පොතුවිල් ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සේතුමදාර් පහුරුදීන් අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායමේ 01 කණ්ඩායම් නායකයාට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම පොතුවිල් ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අබ්දුල් ගෆූර් ඉක්බාල් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින්ද;

පොතුවිල් ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, අත්තනායක මුදියන්සේලාගේ කසුන් ශ්‍රීනාත් අත්තනායක වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් අබ්දුල් ගෆූර් ඉක්බාල්, පොතුවිල් ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**කසුන් ශ්‍රීනාත් අත්තනායක,**
තේරීම්භාර නිලධාරි,
පොතුවිල් ප්‍රාදේශීය සභාව.

2022 මාර්තු මස 06 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

EOG 04-0049